# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 ජනවාරි මස 26 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.02.01 දින නිකුත් කරන ලදී)

# කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ

**ඇපයෙන් සීමිත සමාගමක් වන කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය කොටස්වලින් සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 28.00** **තැපැල් ගාස්තුව : රු. 10.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ

එල්. ඩී. — ඕ. 26/2010.

**ඇපයෙන් සීමිත සමාගමක් වන කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය කොටස්වලින් සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

**1.** මේ පනත 2018 අංක     දරන කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) *ගැසට්* පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

පනතේ පරමාර්ථය.

**2.** මේ පනතේ පරමාර්ථය විය යුත්තේ ඇපයෙන් සීමිත සමාගමක් වන්නා වූ ද 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස බලපත්‍රලත් කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය මේ පනතේ විධිවිධාන ප්‍රකාරව කොටස්වලින් සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීමෙන් අසාමුහිකරණය කිරීමය.

පරිවර්ථනයට අදාළ කාර්ය පටිපාටිය.

**3.** (1) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීම සඳහා නියමිත දිනයේ සිට මාස නවයක කාලයක් ඇතුළත පහත සඳහන් විස්තර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය:—

(අ) අසාමුහිකරණය කරන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ යෝජිත සාංගමික ව්‍යවස්ථාවලිය;

(ආ) මේ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරනු ලබන තැනැත්තන්ගේ නම්; සහ

2—PL 010619 - 475 (2018/01)

(ඇ) අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ආරම්භක කොටස් හිමියන්ගේ නම්.

(2) අමාත්‍යවරයා විසින් නියමිත දිනයේ සිට මාස දෙළහක් ඇතුළත (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ලේඛන (මෙහි මින්මතු "රෙජිස්ට්‍රාවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු අතර, කොටස්වලින් සීමිත සාමාගමක් ලෙස කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාට විධාන කළ යුතු ය.

අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලියාපදිංචි කිරීම.

**4.** (1) 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති ලේඛන සමග අමාත්‍යවරයාගේ විධානය ලැබීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින්, කොටස්වලින් සීමිත සමාගමක් ලෙස කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය වහාම ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර ඒ බවට වන සහතිකයක් නිකුත් කළ යුතු ය.

(2) අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලියාපදිංචි කරන ලද්ද වූ දිනය මේ පනතේ මින්මතු "පරිවර්තනය කළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචිය පිළිබඳ අමාත්‍යවරයා වෙත දන්විය යුතු බව.

**5.** (1) 4 වන වගන්තිය යටතේ අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලියාපදිංචි කිරීමෙන් පසු, එසේ ලියාපදිංචි කළ බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් වහාම අමාත්‍යවරයා වෙත ලිඛිතව දැන්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන තොරතුරු ලැබීමෙන් පසු අමාත්‍යවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දැන්වීමක් මගින් පරිවර්තනය කළ දිනයේ සිට බලාත්මක වන පරිදි කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය කොටස්වලින් සීමිත සමාගමක් බවට පරිවර්තනය කරනු ලැබ ඇති බවට මහජනයා වෙත දැන්විය යුතු ය.

නිකුත් කරනු ලැබිය යුතු කොටස් බෙද වෙන් කිරීම.

**6.** (1) අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදාළව නිකුත් කරනු ලැබිය යුතු කොටස් සංඛ්‍යාව සහ එකී කාර්ය සඳහා කොටස් ප්‍රාග්ධනය බවට පරිවර්තනය කළ යුතු සංචිතවල වටිනාකම පරිවර්තනය කළ දිනයේ සිට එක් මාසයක කාලසීමාවක් ඇතුළත නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාරව අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදාළව නිකුත් කරනු ලැබිය යුතු කොටස්වලින් පිළිවෙළින් සියයට හැටක සහ සියයට හතළිහක ප්‍රතිශතයක් බෙදා වෙන් කරනු ලැබීම සඳහා මේ පනත යටතේ නියමිත දිනයේ දී සාමාජිකයන් සහ මේ පනතේ 15 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල හිමිකම් ලැබිය යුතු ය.

නිකුත් කරනු ලැබිය යුතු කොටස් බෙදා වෙන් කිරීම සඳහා වන ක්‍රියාමාර්ගය.

**7.** (1) 8 වන වගන්තියේ නිශ්චිතව සඳහන් තනි පුද්ගල සාමාජිකයන් වෙත නිකුත් කරනු ලැබිය යුතු කොටස් පිළිබඳ සීමා කිරීමට යටත්ව අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදාළව නිකුත් කරනු ලැබිය යුතු කොටස්වලින් සියයට හතළිහක උපරිමයක් 6 වන වගන්තියේ නියමයන් ප්‍රකාරව සිදු කරනු ලබන නිශ්චය කිරීමෙන් පසු වහාම සාමාජිකයන් වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) 6 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සාමාජිකයන් වෙත බෙදා වෙන් කරන ලද සහ (1) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාරව නිකුත් කරන ලද අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදාළව නිකුත් කරනු ලැබිය යුතු ඉතිරි කොටස් විකිණීමෙන් ලැබෙන මුදල් සඳහා පමණක් සාමාජිකයන් හිමිකම් ලැබිය යුතු ය.

(3) 2007 අංක 7 දරන සමාගම් පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් සාමාජිකයකු විසින්, (2) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාරව එම සාමාජිකයා වෙත නිකුත් කරනු ලැබිය යුතු තනි පුද්ගල කොටස් බෙදා වෙන් කිරීමට අදාළ කොටස් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අමතා යවනු ලබන ලිපියක් මගින් එම සාමාජිකයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තන් වෙත එම සාමාජිකයා විසින් නිශ්චය කරනු ලබන මිලකට සහ කොමිෂන් සභාව විසින් අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ මූලික මහජන නිකුතුව අනුමත කරනු ලබන දිනට පෙරාතුව වූ එම සාමාජිකයා විසින් නිශ්චය කරනු ලබන යම් දිනයක දී නිකුත් කරන ලෙස අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය වෙත උපදෙස් ලබා දිය හැකි ය:

එසේ වුව ද, යම් සාමාජිකයකු (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන

අවස්ථාවක දී, අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් සාමාජිකයන් වෙත වෙන් කරන ලද නමුත් නිකුත් නොකරන ලද කොටස් එහි මූලික මහජන නිකුතුවේ දී, නිකුත් කිරීම සහ බැහැර කිරීම කළ යුතු ය.

(4) 2007 අංක 7 දරන සාමාගම් පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, සාමාජිකයන් වෙත බෙද වෙන් කරන ලද එහෙත් මූලික මහජන නිකුතුවේ දී දයක නොවූ කොටස් අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් අදළ සාමාජිකයන්ගේ උපදෙස් මත එම සාමාජිකයන් විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තන් වෙත එම සාමාජිකයන් විසින් විශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක දී සහ නිශ්චිතව සඳහන් කර ඇති යම් මිලකට නිකුත් කළ යුතු ය.

(5) අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් (3) වන සහ (4) වන උපවගන්තිවල නියමයන් ප්‍රකාරව සිදු කරනු ලබන යම් විකිණීමකින් ලැබෙන මුදල් අදළ සාමාජිකයා වෙත ගෙවිය යුතු ය.

(6) ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල වෙත බෙද වෙන් කරන ලද අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදළව නිකුත් කරනු ලැබිය යුතු කොටස්වලින් සියයට හතළිහක ප්‍රතිශතය විකිණීමෙන් ලැබෙන මුදල් සඳහා පමණක් ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල හිමිකම් ලැබිය යුතු ය.

(7) 2007 අංක 7 දරන සමාගම් පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල විසින්, 6 වන වගන්තියේ නියමයන් ප්‍රකාරව අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදළව නිකුත් කරනු ලැබිය යුතු කොටස්වලින් සියයට හතළිහක ප්‍රතිශතයට අදළ කොටස් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ම, අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ මූලික මහජන නිකුතුවේ දී හෝ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තන් වෙත ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන මිලකට සහ යම් දිනයක දී හෝ නිකුත් කරන ලෙස අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය වෙත උපදෙස් ලබා දිය යුතු ය.

(8) අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් (6) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාරව සිදු කරන ලද යම් විකිණීමකින් ලැබෙන මුදල් ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල වෙත ගෙවිය යුතු ය.

(9) 2007 අංක 7 දරන සමාගම් පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින්, නිකුත් කරන ලද දිනයේ සිට වැඩ කරන දින විසි එකක් ඇතුළත පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නියමිත ආකෘතිය අනුව වූ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දිය යුතු ය:-

(අ) නිකුත් කරන ලද කොටස් සංඛ්‍යාව ;

(ආ) කොටස්වල වටිනාකම ; සහ

(ඇ) කොටස් නිකුත් කිරීමෙන් පසු සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය.

තනි පුද්ගල සාමාජිකයන් සඳහා කොටස් බෙදා වෙන් කිරීම.

**8.** (1) සාමාජිකයන් විසින් යම් සාමාජිකයකු වෙත නිකුත් කළ යුතු කොටස් සම්බන්ධයෙන් එක් එක් තනි පුද්ගල සාමාජිකයකු සඳහා සියයට පහක උපරිම සීමාවකට යටත් ව නියමිත දිනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත, 6 වන වගන්තියේ නියමයන් ප්‍රකාරව සාමාජිකයන් අතර අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදාළව නිකුත් කළ යුතු කොටස්වලින් සියයට හැටක ප්‍රතිශතය බෙදා වෙන් කිරීම පිළිබඳව තීරණය කරනු ලැබිය හැකි ය.

(2) තනි පුද්ගල කොටස් හිමිකාරීත්වය බෙදා වෙන් කිරීම පිළිබඳව එකඟතාවකට එළඹීමට සාමාජිකයන් අපොහොසත් වන අවස්ථාවක දී, 6 වන වගන්තියට අනුකූලව, යම් සාමාජිකයකු වෙත නිකුත් කළ යුතු කොටස් සම්බන්ධයෙන් එක් එක් තනි පුද්ගල සාමාජිකයකු වෙත සියයට පහක උපරිම සීමාවකට යටත් ව, අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සාමාජිකයන් වෙත බෙදා වෙන් කරන ලද කොටස්වලින් සමාන කොටස් ප්‍රමාණයක් ලැබීම සඳහා එක් එක් සාමාජිකයා හිමිකම් ලැබිය යුතු ය.

සාමාජිකයන් විසින් අත්හරින ලද කොටස් සඳහා වන ක්‍රියාමාර්ගය.

**9.** යම් සාමාජිකයකු විසින් ඔහු වෙත කොටස් බෙදා වෙන් කර දෙන ලද දිනයේ සිට මාස දෙකක කාලසීමාවක් ඇතුළත ඔහු වෙත සිදු කරන ලද එම කොටස් බෙදා වෙන් කිරීම අත්හැරිය හැකි අතර අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් එහි

මූලික මහජන නිකුතුවේ දී එම බෙදා වෙන් කරන ලද කොටස් නිකුත් කිරීම සහ විකිණීම සිදු කළ යුතු අතර, එසේ විකිණීමෙන් ලැබෙන මුදල් 15 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල වෙත ගෙවිය යුතු ය.

**10.** (1) අමාත්‍යවරයා විසින් නියමිත දිනයේ සිට මාස දෙකක කාලයක් ඇතුළත අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ලෙස කටයුතු කිරීම සඳහා තැනැත්තන් නිර්දේශ කිරීම පිණිස පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වූ නාමයෝජනා මඩුල්ලක් පිහිටුවනු ලැබිය යුතු ය:— නාමයෝජනා මඩුල්ලේ සංයුතිය.

(අ) 1949 අංක 58 මුදල් නීති පනතේ 12 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ මහ බැංකුවේ අධිපතිවරයා;

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 9 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඈ) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 42 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ පරිදි අවස්ථාවෝචිත පරිදි, කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ හෝ අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු.

(2) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා, නාමයෝජනා මඩුල්ලේ සභාපතිවරයා විය යුතු අතර, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා එහි ලේකම්වරයා බවට පත්විය යුතු ය.

(3) අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය, ලැයිස්තුගත පොදු සමාගමක් බවට පත්වන අවස්ථාවේ දී, නාමයෝජනා මඩුල්ල විසින් ක්‍රියාකාරීත්වය අවසන් කරනු ලැබිය යුතු ය.

සනපූරණය සහ නාමයෝජනා මඩුල්ල විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**11.** (1) නාමයෝජනා මඩුල්ලේ යම් රැස්වීමක් සඳහා සනපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(2) අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයට යම් සාමාජිකයකු නම් කිරීම, ඇගයීම, තෝරා ගැනීම සහ එවන් සාමාජිකයකු ඉවත් කිරීම සඳහා වෙනත් කරුණු අතර අදාළ කරගත යුතු කාර්ය පටිපාටිය නියම කර ඇති පරිදි විය යුතු ය.

(3) නාමයෝජනා මඩුල්ල විසින් එම මඩුල්ල පිහිටුවීමෙන් පසු මාස තුනක කාලසීමාවක් ඇතුළත නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අවුරුදු තුනක කාලසීමාවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කිරීම සඳහා යම් තැනැත්තන්ගේ නම් කොමිෂන් සභාව වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, කොමිෂන් සභාව විසින් අනුමත කිරීම.

**12.** (1) කොමිෂන් සභාව විසින්, නාමයෝජනා මඩුල්ලේ නිර්දේශයන් ලැබීමෙන් පසුව, තෝරාගැනීමේ නිර්ණායක සැලකිල්ලට ගනිමින්, අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයට තැනැත්තන් පත් කිරීම සඳහා අනුමතය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් යම් හේතු දක්වමින් අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එකී හේතු නාමයෝජනා මඩුල්ල වෙත දන්වනු ලැබිය යුතු ය.

නාමයෝජනා මඩුල්ල නැවත කැඳවනු ලැබිය යුතු අවස්ථා.

**13.** අමාත්‍යවරයා විසින්-

(අ) මියයාම, ඉල්ලා අස්වීම හෝ සිය ධුර කාලය ඉකුත්වීමට පෙර ධුරයෙන් ඉවත් කිරීම යන හේතු මත, අධ්‍යක්ෂවරයකු විසින් ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී හෝ එකී පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසු තැනැත්තකු නිර්දේශ කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී ; හෝ

(ආ) එක් එක් වාරයක් සම්බන්ධයෙන් වසර තුනකට නොවැඩි තවදුරටත් වූ කාලසීමාවක් සඳහා අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංස්ථාපනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ධුර කාලය ඉකුත්වීමේ දී අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලැයිස්තුගත නොකර පවතින අවස්ථාවක දී,

නාමයෝජනා මඩුල්ල නැවත කැඳවනු ලැබිය යුතු ය.

අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය.

**14.** (1) පරිවර්තනය කළ දිනයේ දී කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ධුරයන් දැරීම අවසන් කරනු ලැබිය යුතු ය.

(2) 12 වන වගන්තියේ නියමයන් ප්‍රකාරව අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස ක්‍රියාකිරීම සඳහා නාමයෝජනා මඩුල්ලේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇති යම් තැනැත්තන් පරිවර්තනය කළ දිනයේ සිට පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර එම දිනයේ සිට වර්ෂ තුනක කාලසීමාවක් සඳහා එම තැනැත්තන් ධුර දරනු ලැබිය යුතු අතර නැවත පත් කරනු ලැබීම් සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන පරිදි හත් දෙනකුගෙන් සමන්විත විය යුතු ය:—

(අ) කොටස් තැරැව්කරුවන් නියෝජනය කරනු ලබන තැනැත්තන් තුන්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් ; සහ

(ආ) ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරනු ලැබූ තැනැත්තන් හතරදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක්.

(4) අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරුන් අතුරින් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල පිහිටුවීම.

**15.** (1) කොමිෂන් සභාව විසින් මහජන සුභසිද්ධිය උදෙසා නියමිත දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත ප්‍රග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් සංස්ථාපනය කරනු ලැබිය යුතු අතර, එම සමාගමේ සාමාජිකයන් අවස්ථාවෝචිත පරිදි කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය හෝ අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය සහ කොමිෂන් සභාව විය යුතු ය.

(3) ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුදල විසින් 7 වන හා 9 වන වගන්ති ප්‍රකාරව එය වෙත ගෙවන ලද අරමුදල්—

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම;

(ආ) ආයෝජක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ප්‍රාග්ධන වෙළෙඳපොළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම; සහ

(ඈ) ප්‍රාග්ධන වෙළෙඳපොළට ආයෝජකයන්ට ඇති ප්‍රවේශය සහ සහභාගීත්වය වැඩිදියුණු කිරීම,

තුළින් මහජන සුභසිද්ධිය සැලසීමේ කාර්ය සඳහා යොදා ගත යුතු ය.

(4) (2) වන උපවගන්තිය ප්‍රකාරව සංස්ථාගත කරන ලද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය:—

(අ) අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ප්‍රධාන විධායක නිලධරයා;

(ආ) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ

(ඇ) කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සභාපතිවරයාගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන තැනැත්තකු,

යන අය විය යුතු ය.

අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලැයිස්තුගත කිරීම.

**16.** අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් ලිඛිතව නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස, අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පරිවර්තනය කළ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් ඇතුළත කොමිෂන් සභාවේ අනුමතය ඇතිව අසාමුහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය එම විනිමය ස්ථානයේ ම ලැයිස්තුගත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

**17.** (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලැයිස්තුගත කිරීමට පෙර අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් එහි කොටස්හිමියන්ට ලාභාංශ ගෙවීම හෝ තවදුරටත් කොටස් නිකුත් කිරීම සිදු නොකළ යුතු ය.

ලැයිස්තුගත කිරීමට පෙර බෙදා හැරීම සහ තවදුරටත් නිකුත් කිරීම් සිදු නොකළ යුතු බව.

(2) 2007 අංක 7 දරන සමාගම් පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ලැයිස්තුගත කිරීමෙන් පසු ලාභාංශ ගෙවීමෙන් හෝ තවදුරටත් කොටස් නිකුත් කිරීමෙන් කොටස්හිමියන් වෙත උපචිත වන්නා වූ ඡන්දය දීමේ අයිතීන් හැර යම් ප්‍රතිලාභයක් අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් 6 වන වගන්තිය ප්‍රකාරව නිකුත් නොකරන ලද සහ බෙදා වෙන් කරන ලද කොටස් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ගෙවීම හෝ බෙදා වෙන් කිරීම සිදු කළ යුතු ය.

(3) අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් තම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ ලැයිස්තුගත කිරීමට පෙර කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් අනුමත කර ඇති පරිදි හෝ හැර, ණයට දීම හෝ ණයට ගැනීම නොකළ යුතු ය.

**18.** අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය ලියාපදිංචි කිරීමෙන් පසු-

අසාමූහිකරණය කිරීමෙන් පසු ලැයිස්තුගත සමාගම් සහ පාලිත සමාගම්වල තත්ත්වය.

(අ) ඇපයෙන් සීමිත කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ලැයිස්තුගත කළ සෑම සමාගමක් ම අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ලැයිස්තුගත කළ සමාගමක් විය යුතු බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සෑම පාලිත සමාගමක් ම අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ පාලිත සමාගමක් විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට ප්‍රදානය කරන ලද බලපත්‍රය අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**19.** කොමිෂන් සභාව විසින් පනවනු ලැබිය හැකි යම් නියමයන් හෝ කොන්දේසිවලට යටත්ව, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස ක්‍රියා කිරීමට, ඇපයෙන් සීමිත කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට ප්‍රදානය කරන ලද බලපත්‍ර පරිවර්තනය කළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රයේ කල් ඉකුත්වන දින තෙක් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස ක්‍රියා කිරීම සඳහා අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

දේපළ, අයිතිවාසිකම් සහ බැරකම් පැවරීම.

**20.** පරිවර්තනය කළ දිනයේ සිට පවතින්නා වූ ඇපයෙන් සීමිත කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සියලු දේපළ අයිතීන්, සම්බන්ධතාවයන් සහ බැරකම් අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ දේපළ අයිතීන්, සම්බන්ධතාවයන් සහ බැරකම් ලෙස පැවතිය යුතු ය.

නියෝග.

**21.** (1) නියම කළ යුතු බවට මේ පනත මගින් නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනත මගින් නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එය පළකරනු ලබන දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී ඒ නියෝග බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම එය *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසුව හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබුවේ යයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

**22.** (1) පරිවර්තනය කළ දිනයට පෙරාතුව ම වූ දිනයේ සිට පවතින කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය සමග එළඹුනු සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් හෝ එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් නිකුත් කළ හෝ ඒ හා සමග අත්සන් කළ යම් ලේඛනයක් පරිවර්තනය කළ දින සිට බලපැවැත්වෙන පරිදි අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය සමග එළඹුනු කොන්ත්‍රාත් සහ ගිවිසුම් හෝ එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් නිකුත් කළ හෝ ඒ හා සමග අත්සන් කළ ලේඛන ලෙස සලකනු ලැබිය යුතු ය. ව්‍යාවර්තන.

(2) පරිවර්තනය කළ දිනයට පෙරාතුව ම වූ දිනයේ අවසන් නොවූ කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් හෝ එයට එරෙහිව පවරන ලද සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතු පරිවර්තනය කළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් හෝ එයට එරෙහිව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

(3) පරිවර්තනය කළ දිනයට පෙරාතුව වූ දිනයේ සෑහීමකට පත් නොවී පවතින කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් එළඹුන හෝ සිදු කරන ලද සියලු තීන්දු සහ ප්‍රදාන පරිවර්තනය කළ දින සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය වෙනුවෙන් හෝ එයට එරෙහිව එළඹුන හෝ දෙන ලද තීන්දු හෝ ප්‍රදාන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

(4) පරිවර්තනය කළ දිනයට පෙරාතුව වූ දිනයේ පවතින කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් යම් තැනැත්තකුට හෝ ආයතනයකට නිකුත් කරන ලද සියලු ලේඛන, මාර්ගෝපදේශ සහ රීති පරිවර්තනය කළ දින සිට බලපැවැත්වෙන පරිදි අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් නිකුත් කළ ලේඛන, මාර්ගෝපදේශ සහ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව අදාළ තැනැත්තන්ට හෝ ආයතනවලට අදාළ කරගනු ලැබිය යුතු ය.

(5) පරිවර්තනය කළ දිනයට පෙරාතුව වූ දිනයේ කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සියලු ලේඛන, විධාන සහ රීති පරිවර්තනය කළ දින සිට බලපැවැත්වෙන පරිදි අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට කොමිෂන් සභාව විසින් නිකුත් කළ ලේඛන, විධාන සහ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) පරිවර්තනය කළ දිනයට පෙරාතුව වූ දිනයේ පවතින කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සියලු වත්කම් සහ බැරකම්, පරිවර්තනය කළ දින සිට බලපැවැත්වෙන පරිදි අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ වත්කම් සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) පරිවර්තනය කළ දිනයට පෙරාතුව වූ දිනයේ කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් සේවයේ යොදවන ලද සියලු නිලධරයන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්, පරිවර්තනය කළ දිනයට පෙරාතුව වූ දිනයේ ඔවුන්ට අදාළව තිබුණා වූ නියමයන් සහ කොන්දේසිවලට වඩා වාසි සහගතභාවයෙන් අඩු නොවන යම් නියමයන් සහ කොන්දේසි මත පරිවර්තනය කළ දින සිට බලපැවැත්වෙන පරිදි අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් සේවයේ නියුක්ත කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ පහසුකම් වෙත ප්‍රවේශ වීම සඳහා එහි සාමාජිකයන් හා වෙළෙඳ සාමාජිකයන් වෙත පැවරී ඇති සියලු අයිතීන්, අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය යටතේ පවත්වාගෙන යා යුතු ය.

**23.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"කොටස්වලින් සීමිත සමාගම" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද පුද්ගලික සමාගමක් නොවන සීමිත සමාගමක් අදහස් වේ;

"ඇපයෙන් සීමිත සමාගම" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඇප සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද සමාගමක් අදහස් වේ;

"කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද ඇපයෙන් සීමිත කොලම්බෝ ස්ටොක් එක්ස්චේන්ජ් අදහස් වේ;

"අසාමූහිකරණය කළ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන්නෙන්, 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරන ලද කොටස්වලින් සීමිත කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අදහස් වේ;

"ස්වාධීන අධ්‍යක්ෂවරයා" යන්නෙන්, කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සාමාජිකයකු හෝ වෙළෙඳ සාමාජිකයකු සමග සෘජුව හෝ වක්‍රව සම්බන්ධවන තැනැත්තකු හෝ අධ්‍යක්ෂවරයකුගේ වගකීම් ක්‍රියාවට නැංවීමේ දී එම අධ්‍යක්ෂවරයාගේ ස්වාධීන විනිශ්චය ක්‍රියාත්මක කිරීමට සැලකිය යුතු බලපෑමක් සිදු කළ හැකි සබඳතාවක් හෝ අවස්ථාගත කරුණක් පවතින වෙනත් යම් තැනැත්තකු නොවන යම් තැනැත්තකු අදහස් වේ;

"ලැයිස්තුගත පොදු සමාගම" යන්නට, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුත්තේ ය;

"සාමාජිකයා" යන්නෙන්, ඡන්දය දීමේ අයිතිවාසිකම සතු කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සාමාජිකයකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

“දේපළ” යන්නෙන්, යම් නිශ්චල හෝ චංචල දේපළක් අදහස් වන අතර,

(අ) සාධාරණ හෝ නෛතික යම් සම්බන්ධතාවක්, පරවශතාවක් හෝ අයිතිවාසිකමක්, පවත්නා හෝ අනාගත පවරා දෙන ලද හෝ අවිනිශ්චිත හිමිකමක්, හිමිකම්පෑමක්, නඩුකාරක දේපළක්, බලතල හෝ වරප්‍රසාද හෝ අන්‍යාකාරයකට ඇති වටිනාකමක්;

(ආ) සම්පූර්ණ සම්බන්ධතාවයක් හෝ අඩු සම්බන්ධතාවයක් සඳහා සන්තකය දරන හෝ අවිනිශ්චිත අයිතියක් ඇති අයිතිකරු විසින් යම් නිශ්චල දේපළක් පැවරීම, සතු කිරීම, නියම කිරීම, භාර දීම සඳහා ලියා අත්සන් කරන ලද ඔප්පුවක් නැතහොත් යම් නිශ්චල දේපළක් පැවරීම හෝ බැහැර කිරීම ද;

(ඇ) බැංකු සටහන්, භාරක සටහන්, භාණ්ඩාගාර බිල්පත්, ලාභාංශ, බලපත්‍ර, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, චෙක්පත් සහ ගනුදෙනු කළ හැකි තැන්පතු සහතික ඇතුළු යම් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර;

(ඈ) නෛතික හෝ සාධාරණ යම් උකසක් හෝ ගාස්තුවක්, සත්‍ය හෝ අනුමිත ඇපකරයක්, කැප අයිතියක් හෝ ඔඩපනයක්, උකස් කිරීමේ ලිපියක් හෝ භාර ලදුපත් හෝ හානිපූරණයක් හෝ වර්තමාන හෝ අනාගත පවරන ලද හෝ අවිනිශ්චිත ණය මුදලක් හෝ බැරකමක් ගෙවීම හෝ නිදහස් කිරීම සඳහා වන පොරොන්දුවක් හෝ වෙනත් ආකාරයක ඇපයක්; හෝ

(ඉ) සුරැකුම්පත් හා වෙනත් ආකාරයක නිශ්චිත හෝ නිශ්චිත නොවන දේපළක්,

ඊට ඇතුළත් වේ;

"සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පත් කළ සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා හෝ එම පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයාගේ කාර්යය ඉටු කරනු ලබන වෙනත් යම් නිලධරයකු අදහස් වේ;

"සංචිත" යන්නට, කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සමුච්චිත අරමුදල සහ රඳවාගත් ඉපැයීම් ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.